# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2015 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2015 මාර්තු මස 02 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2015 මාර්තු මස 06 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **4.00 යි.** තැපැල් ගාස්තුව **:** රු. **20.00 යි.**

## 2015 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2015 මාර්තු මස 02 වන දින]

එල්.ඩී.—ඕ. 36/2014.

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2015 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 49 වන වගන්තිය එම වගන්තියේ (2අ) උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1996 අංක 2 දරන පනතේ 49 වගන්තිය සංශෝධනය කිරීම.

"(2අ) මේ පනතේ 14අ සහ 14ඊ වගන්තිවල සඳහන් විධිවිධාන උල්ලංඝනය කරන හෝ එම විධිවිධානවලට අනුකූලවීම පැහැර හරින යම් තැනැත්තකු වරදක් සිදුකරනු ලබන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිටදී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී එම තැනැත්තා වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා වන බන්ධනාගාර ගත කිරීමකට හෝ පහත උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති ධීවර බෝට්ටුවේ දිග සැලකිල්ලට ගනිමින් නිශ්චය කරනු ලැබිය යුතු එහි II තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති දඩ මුදලට අඩු නොවන දඩ මුදලක් ගෙවීම සඳහා යටත් විය යුතු ය:—

උපලේඛනය

| I *වන තීරය* | II *වන තීරය* |
|---|---|
| බෝට්ටුවේ දිග | දඩ මුදල |
| මීටර් 10.3 සිට මීටර් 15ට අඩු | රුපියල් මිලියන 1.5 |
| මීටර් 15 සිට මීටර් 24ට අඩු | රුපියල් මිලියන 5 |
| මීටර් 24 සිට මීටර් 45ට අඩු | රුපියල් මිලියන 75 |
| මීටර් 45 සිට මීටර් 75 දක්වා | රුපියල් මිලියන 120 |
| මීටර් 75ට වැඩි | රුපියල් මිලියන 150" |

2—PL008751 -2,800 (2015/01)

ප්‍රධාන ප්‍රඥප්තියේ 52අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 52අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය.

"අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන නොතකා මහේස්ත්‍රාත් අධිකරණයට අධිකරණ බලය ඇතිබව.

52අ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 11 වන වගන්තියේ සහ 14 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොසලකා මේ පනතේ නිශ්චිතව සඳහන් වැරදි විභාග කිරීම සඳහා සහ මේ පනතේ එම වැරදි සඳහා විධිවිධාන සලස්වා ඇති දඩ මුදල් පැනවීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මෙම පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු යි.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.